# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 78 — 1973 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා — 1973.09.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටු |
|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්... ... ... ... | 187 |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | 188 |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... ... | — |


සැලකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරණ අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරණ රජයේ වැඩ අධ්‍යක්ෂ (නිල නාමය වෙනස් කිරීම) පිළිබඳ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 38 දරණ මහා නගර සභා (සංශෝධන) පනත 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ දෙවන කොටසේ අතිරේකයන් වශයෙන් පලවේ. (ii) ජාතික ලේඛනාරක්ෂක පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල පනත් කෙටුම්පත සහ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 14 දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පල කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද, භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය දක්වනු ලැබේ.

### ''ඒ'' කොටසේ හෝ ''බී'' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ " ඒ " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ " බී " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් " බී " අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළ වන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළ කිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළ කිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළ කර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරණ පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සැහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස වෙනත් විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙද ලකුණේ අංකය : 33,932. (2) ලැබුණ දිනය : 1971 ඔක්තෝබර් මස 20 දින. (3) ඉල්ලුම් කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : කාරියවසම් හපුතන්ත්‍රිගේ සිරිල් ජයරත්න (සිලෝන් ඉලෙක්ට්‍රොනික් ඉන්ඩස්ට්‍රීස් යනුවෙන් ව්‍යාපාරික) අංක 251/5, වරාගොඩ, කැලණිය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : පී. සෙන්ට් එල්. ද කොස්තා මයා, අංක 243, හල්ව්ස්ඩෝර්ෆ් වීදිය, කොළඹ 12. (5) පන්තිය : 8. (6) බඩු : ගුවන් විදුලි යන්ත්‍ර, අන්තර් පණිවුඩ හුවමාරු කිරීමේ උපකරණ සහ ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස්. (7) වෙළඳ ලකුණේ සටහන :




ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 11 දින.

9-636 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,849. (2) ලැබුණ දිනය : 1971 සැප්තැම්බර් මස 7 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : චයිනා නැෂනල් ලයිට් ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට්ස් අයි ඇන්ඩ් ඊ කෝර්පරේෂන් (චීනයේ නීති යටතේ විධිමත්ව සංවිධානයව පවත්වා ගෙන යනු ලබන සංස්ථාවකි) අංක 172, ලියෝනිං පාර, ටිඑන්සිං, චීනය ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ෆ්‍රැන්සිස් පී. ජේ. සෙනෙවිරත්න මයා, ෆ්‍රැන්සිස් සෙනෙවිරත්න ඉන්ටර්නැෂනල්, අංක 51, 1 වන හරස් වීදිය, කොළඹ 11. (5) පන්තිය : 49. (6) බඩු : පාපන්දු, බාස්කට් පන්දු, අත්පන්දු, බැඩ්මින්ටන් සහ මේස ටැනිස් කට්ටල, පාපන්දු සපත්තු. (7) වෙළඳ ලකුණේ සටහන :




| අනුරූපයෙනි සඳහන් | අක්ෂර පරිවර්තනය | භාෂා පරිවර්තනය |
|---|---|---|
| චීන අක්ෂර | ලු පායි | මුවා ලකුණ |

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජනවාරි මස 12 දින.

9-630 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 31,732. (2) ලැබුණ දිනය : 1969 ජූලි මස 25 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : මේරි ලෝඩ්ස් මෝතා, ජෝෂප් ක්ෂේවියර් නැසරින් මෝතා සහ මේරි ලෝඩ්ස් රෝසරි ෆිලෝමිනා මෝතා (එම්. ජේ. කාවල්හෝ ප්ලාස්ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස් යනුවෙන් ව්‍යාපාරික). (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : මුරුගේසු සහ කුලරත්න මහතුන්, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1. (5) පන්තිය : 50. (6) බඩු : ප්ලාස්ටික් බොත්තම්, පීවීසී පයිප්ප, බැද්දුම් සහ විදුලි සන්නායන වැඩ සඳහා පාවිච්චි කරන උපාංග හැර ප්ලාස්ටික් අච්චු භාණ්ඩ සහ නිරසන භාණ්ඩ. (7) වෙළඳ ලකුණේ සටහන.

polyset

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 මැයි මස 24 දින.

9-618 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 35,047. (2) ලැබුණ දිනය : 1973 මාර්තු 8 වැනිදා. (3) ඉල්ලුම් කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : රොන්සන් කෝපරේෂන් (ඇමරිකා එක්සත් ජනපදය, නිව් ජර්සි රාජ්‍යය නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සංස්ථාවකි.) අංක 1 රොන්සන් පාර, වුඩ් බ්‍රිජ්, නිව් ජර්සි රාජ්‍යය ඇමරිකා එක්සත් ජනපදය, නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : වික්ටර් ඒ. ජේ. මැන්දිස් මහතා නොග්රීස් ගොඩනැගිල්ල, කොළඹ 1. (5) පන්තිය : 13. (6) බඩු : ධූම පානය කරන්නන්ගේ දුම්වැටි දල්වනයන් සහ ඒවායේ කොටස්, සවි කිරීම සහ ඒවා සඳහා උපාංග. (7) වෙළඳ ලකුණේ සටහන :

**R O N I L**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජූනි මස 1 දින.

9-621 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

**ශුද්ධියකි**

1971 ජූලි මස 2 වෙනි දින පලකරන ලද අංක 14,965 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වෙ. ල. අංක 30532 සම්බන්ධ නිවේදනයෙහි අංක (6) මෙසේ සංශෝධනය විය යුතුය.

(6) බඩු : චොකලට්, ටොෆි සහ රසකැවිලි.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
1972 ජූනි 20 දින.

9-608 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගෙ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.